Article 12(1)

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2019-01-25 |

පැමිණිලිකරුවන් : ඩී.එම්.කේ. දිසානායක ඇතුළු පිරිස,
නො : 97/3 සී, හැඩිගම,
පිළියන්දල.

වගඋත්තරකරුවන් :

01. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

02. පළාත් අධ්‍යාපන ලේකම් (බ.ප)
බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යංශය,
රන්මගපාය, බත්තරමුල්ල.

03. දකුණු පළාත් අධ්‍යාපන ලේකම්,
දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යංශය,
දක්ෂිණපාය, ලබුදූව, ගාල්ල.

04. ඌව පළාත් අධ්‍යාපන ලේකම්,
ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යංශය,
ඌව පළාත් සභාව, බදුල්ල.

05. සබරගමුව පළාත් අධ්‍යාපන ලේකම්,
සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යංශය,
රත්නපුර.

06. උතුරුමැද පළාත් අධ්‍යාපන ලේකම්,
උතුරු මැද පළාත් අධ්‍යාපන අමාත්‍යංශය,
පොළොන්නරුව.


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 165, කිංසි පාර, කොළඹ - 08. / 165, கின்சி வீதி, கொழும்பு - 08. / 165, Kynsey Road, Colombo - 08.
සභාපති / தவிசாளர் / Chairman: 011-2696470
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2696470
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
දුරකථන / தொலைபேசி / Telephone: 94 - 11 - 2694925, 2685980, 2685981
ලේකම් / செயலாளர் / Secretary: 011-2689558
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2689558, 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

07. මධ්‍යම පළාත් අධ්‍යාපන ලේකම්
මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය,
පල්ලෙකැලේ, කුණ්ඩසාලේ.

08. නැගෙනහිර පළාත් අධ්‍යාපන ලේකම්,
නැගෙනහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය,
ත්‍රිකුණාමලය.

09. වයඹ පළාත් අධ්‍යාපන ලේකම්,
වයඹ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය,
පළමු මහල, පළාත් සභා සංකීර්ණය,
කුරුණෑගල.

<u>පැමිණිලි අංකය : **HRC/1983/17**</u>

ඉහත පැමිණිලිකරුවන් විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තම කණ්ඩායම විදුහල්පති තනතුරේ වැඩ බැලීමේ රාජකාරී කරන පිරිසක් වන බවත් මීට පෙර තම කණ්ඩායම හට විදුහල්පතිවරුන් වෙත ගෙවන විදුහල්පති විශේෂ දීමනාව ලැබුනු බවත්, 2017.03.17 දිනැති 16/2017 චක්‍ර ලේඛනය හා 2017.03.19 දිනැති අධ්‍යාපන ලේකම්ගේ උපදෙස් ලිපිය අනුව විදුහල්පති විශේෂ දීමනාව වැඩිකර ඇති බවත්, ඉන් අනතුරුව පැමිණිලිකරුවන් හට එම දීමනාව ගෙවීම නතර කර ඇති බවත්ය.

පැමිණිලි පාර්ශවය විසින් කරුණු ඉදිරිපත් කරමින් තවදුරටත් ප්‍රකාශ කර ඇත්තේ, ලංකාවේ දිස්ත්‍රික් 25 ට අයත් රජයේ පාසල් 10,162 ක් පමණ වන අතර අදාළ 2017.02.07 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් ඉහත සඳහන් 10,162 හි විදුහල්පතිවරුන් සඳහා අදාළ දීමනාව ගෙවිය යුතු බවට විෂයභාර අමාත්‍යවරයා අමාත්‍ය මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත් කර ඇති බවයි. ඒ අනුව පැමිණිලිකරුවන් විසින් ප්‍රකාශ කර ඇත්තේ එම වරප්‍රසාදය ඔවුන්ට නැවත වතාවක් ලබාදිය යුතු බවත් තවද සේවය කරනතාක් දුරට ඔවුන්ගේ සේවය වෙනුවෙන් එම මුදල ලැබිය යුතු බවත්ය. ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී යම් ආකාරයකට මධ්‍යම රජය සහ පළාත් සභාව විසින් විකල්ප යෝජනා සකස් කරන්නේ නම් එය රජයේ කාර්යයක් වන අතර, එම විකල්ප යෝජනා ක්‍රියාත්මක කරනතෙක් වැඩබලන ගුරු සේවයේ නියුතු මෙම පැමිණිලිකරුවන් හට හිමිවිය යුතු දීමනාව අනිවාර්යයෙන්ම ලැබිය යුතු බවත්, එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(2) ව්‍යවස්ථාව මඟින් පැහැදිලිව තහවුරු වී ඇති බවත් සඳහන් කර ඇත.

තවද කිසිදු නිලධාරියෙකුට අමාත්‍ය මණ්ඩල තීරණය සහ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් බලය පවරා ඇති පළාත් අධ්‍යාපන සේවයට මධ්‍යම ආණ්ඩුවේ නිලධාරීන් වශයෙන් බලපෑම් කිරීම කළ නොහැකි බවත්, එවැනි බලපෑමක් කරමින් යම් නිලධාරියෙක් හෝ ලේකම්වරයෙක් විසින් දැනට සේවය ගනිමින් අදාළ මුදල නොගෙවා සිටින්නේ නම් එය දුෂ්කර සහ අති දුෂ්කර පාසල් වල අධ්‍යාපනය ලබන ශිෂ්‍යයින් වෙනුවෙන් කරනු ලබන බරපතල අසාධාරණයක් බවත් ප්‍රකාශ කර ඇත. ඒ අනුව මෙම ලේඛන සහ සියළු කරුණු සලකා පැමිණිලිකරුවන් වෙත සාධාරණ නිර්දේශයක් ලබාදෙන මෙන් සහ අදාළ දීමනාව නවතා දැමූ දිනයේ සිට මෙම වැඩබලන තනතුරේ සේවය අධ්‍යාපන බලධාරීන් විසින් අවසන් කරන තෙක් එම වැඩබලන ගුරු සේවයේ විදුහල්පතිවරුන් සඳහා වෙන්කොට ඇති විදුහල්පති විශේෂ දීමනාව ගෙවන ලෙසට නිර්දේශයක් නිකුත් කරන ලෙස ගරු කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටී.

02 වන සහ 09 වන වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

මේ සම්බන්ධයෙන් මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙනුවෙන් පෙනී සිටින නිලධාරි මහතා ප්‍රකාශ කර ඇත්තේ, මධ්‍යම පළාතේ පාසැල් 1521 ක් ඇති බවත් ශ්‍රේණිධාරී නිලධාරි සංඛ්‍යාව 2142 ක් බවත්, වැඩබලන විදුහල්පතිවරු (ශ්‍රී ලංකා ගුරු සේවයේ) සංඛ්‍යාව 466 ක් බවත්ය. මේ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය ලබා ගන්නා ප්‍රතිපත්තිමය තීරණයකට මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය එකඟ වන බවද ප්‍රකාශ කර ඇත.

නැගෙනහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙනුවෙන් මානව හිමිකම් කොමිෂන් සභාවේ පරීක්ෂණයට පෙනී සිටින සහකාර ලේකම් ඩී.එම්.ආර්.සී දසනායක මහතා ප්‍රකාශ කර ඇත්තේ, පළාතේ ඇති පාසල් සංඛ්‍යාව 1113 ක් බවත්, පාසල් 304 ක ගුරු සේවයේ නිලධාරීන් වැඩබලන විදුහල්පති ලෙස කටයුතු කරන බවත්ය. මෙම දීමනාව ලබා දීම පිළිබඳව අමාත්‍යාංශයේ ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නේ නම් එම තීන්දුව අනුව කටයුතු කළ හැකි බවත් සඳහන් කර ඇත.

ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙනුවෙන් සහකාර ලේකම් ඒ.එච්.එම් චින්තක මහතා ප්‍රකාශ කර ඇත්තේ, පළාත් පාසැල් 860 ක් ඇති බවත්, ශ්‍රේණිධාරී විදුහල්පති සංඛ්‍යාව 614 ක් වන අතර වැඩබැලීමේ විදුහල්පතිවරු සංඛ්‍යාව 246 ක් බවත්ය. රේඛීය අමාත්‍යාංශය විදුහල්පති විශේෂ දීමනාව ගෙවීමට එකඟ නම් පළාත් සභාව ලෙස ගෙවීම් කිරීමට ගැටළුවක් නොමැති බවද ප්‍රකාශ කර ඇත.

වයඹ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙනුවෙන් සහකාර ලේකම් පී.බී.ඒ ලක්මාලි මහත්මිය ප්‍රකාශ කර ඇත්තේ, විදුහල්පතිවරු සඳහා විශේෂ දීමනාවක් ලබාදීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය නිකුත් කරන ලද 2017.03.14 දිනැති 16/2017 චක්‍ර ලේඛනය මගින් වයඹ පළාත් පාසල් වල සේවයේ නියුක්ත වැඩ බලන විදුහල්පතිවරුන් සඳහාද එම දීමනා ගෙවීම් සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ

අනුමැතිය ලබාගෙන ඇති අතර, මේ වන විට පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් එම දීමනාව ගෙවීම සඳහා කටයුතු කරමින් පවතින බවයි.

දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙනුවෙන් පෙනී සිටි සහකාර අධ්‍යක්ෂ එම්.සී පලාවිල මහත්මිය ප්‍රකාශ කර ඇත්තේ, පාසල් 1048 ක වැඩබලන විදුහල්පතිවරු 315 ක් සිටින අතර, රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය ලැබෙන්නේ නම් එම විදුහල්පති විශේෂ දීමනාව ගෙවීමට විරෝධතාවයක් නොමැති බවයි.

සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙනුවෙන් සහකාර ලේකම් කේ.කේ රවීන්ද්‍රා මාලනී මහත්මිය ප්‍රකාශ කර සිටින්නේ, පළාත තුළ පාසල් 1255 ක් ඇති බවත්, 2411 ක් ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් සිටින බවත් ඔවුන් විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති සහ සහකාර විදුහල්පති තනතුර දරණ බවත්, වැඩ බලන විදුහල්පතිවරුන් 200-250 ක් පමණ පළාත තුළ සිටින බවත්ය. එසේම දැනට පුරප්පාඩු 581 ක් පමණ පළාත තුළ තිබෙන බවද ප්‍රකාශ කර ඇත. තවද බස්නාහිර පළාත තුළද මතුගම වැනි දුෂ්කර පළාත් වලට විදුහල්පති ශ්‍රේණිධාරීන් පත්කිරීමට ප්‍රායෝගික ගැටළු තිබූ බවත්, ඒ අනුව එම විද්‍යාල වල වැඩකරන ගුරුවරුන් වැඩ බැලීමේ තනතුර සඳහා පත්කිරීම සිදුකරන ලද බවත් ප්‍රකාශ කර ඇත. එමෙන්ම වැඩබලන විදුහල්පති ලෙස පත්කරන ලද අවුරුදු 03 කට වඩා පැරණි අය ඉවත් කිරීමක් සිදුනොකළ බවත්, ඔවුන්ට තවදුරටත් එම වැඩබැලීමේ තනතුරු ලබා දී ඇති බවත්, එමෙන්ම රේඛීය අමාත්‍යාංශය මඟින් මේ සම්බන්ධයෙන් ගන්නා තීරණය අනුව කටයුතු කිරීමට එකඟ වන බවද ප්‍රකාශ කර ඇත.

1 වන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :-

මේ සම්බන්ධයෙන් අධ්‍යාපන ලේකම්වරයා වෙනුවෙන් පෙනී සිටි සහකාර ලේකම් එම්.එම් නිලන්ති කුමාරි මහත්මිය ප්‍රකාශ කර ඇත්තේ, අමාත්‍යාංශය මඟින් 2017.03.17 දින නිකුත් කරන ලද 16/2017 චක්‍රලේඛනය හා ඊට අදාළ 2017.03.29 දිනැති උපදෙස් ලිපිය මඟින් විදුහල්පතිවරු සඳහා ලබා දෙන දීමනාව සංශෝධනය කර ඇති අතර, එම චක්‍රලේඛනයට අදාළව එකී දීමනාව හිමිවන්නේ විදුහල්පති තනතුරක නිත්‍ය වශයෙන් රාජකාරී කරනු ලබන හෝ එම තනතුරක වැඩ බලන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ හෝ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් සඳහා පමණක්ය.

පැමිණිල්ල මඟින් විදුහල්පති සේවයේ රාජකාරී ආවරණය කරන ගුරු සේවයේ නිලධාරීන් වැඩබලන විදුහල්පති දීමනාව ලබාදෙන ලෙස ඉල්ලා ඇතත්, එම නිලධාරීන්ගේ නිත්‍ය සේවය ගුරු සේවය වන අතර ඔවුන් එම දීමනාවට චක්‍රලේඛන ප්‍රකාරව සුදුසුකම් නොලබන බවද එසේම අධිසේවක පදනම මත පත්ව ඇති විදුහල්පති සේවයේ පත්වීම් ලැබූ නිලධාරීන්ටද විදුහල්පති සේවයේ වැටුප් හිමිකම් තිබුණද, පත්වීම් ලිපි කොන්දේසි අනුව ඔවුන්ගේ නිත්‍ය සේවය ගුරු සේවය වන අතර, ඔවුන් නිත්‍ය

විදුහල්පතිවරුන්ට අදාළ වරප්‍රසාදයන්ට හිමිකම් නොලබන බවද සඳහන් කර ඇත. මීට අමතරව විදුහල්පති සේවයේ පුරප්පාඩු සඳහා 2015 (2016) වර්ෂයේ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III පන්තියට බඳවා ගත් 3858 දෙනකු අතරින් පත්වීම් භාරගත් 3781 ක ප්‍රමාණයක් පළාත් රාජ්‍ය සේවය සඳහා මුදාහැර ඇති අතර, නැවත අභියාචනා මගින් සුදුසුකම් සම්පූර්ණ කළ විදුහල්පතිවරුන් 43 ක් අතරින් පත්වීම් භාරගත් 42 ක ප්‍රමාණයද මේ වන විට පළාත් පාසල් වෙත මුදාහැරීමට කටයුතු කර ඇති බවද ඒ අනුව මුළු ප්‍රමාණය 3823 ක් වන බවද දක්වා ඇත. උතුරු පළාතට 403ක්ද, නැගෙනහිර පළාතට 337 ක්ද, බස්නාහිර පළාතට 805 ක්ද, දකුණු පළාතට 502 ක්ද, වයඹ පළාතට 428 ක්ද, මධ්‍යම පළාතට 600 ක්ද, උතුරු මැද පළාතට 253 ක්ද, ඌව පළාතට 239 ක්ද, සබරගමුව පළාතට 256 ක්ද වශයෙන් මුදාහැර ඇති බව සඳහන් කොට ඇත. ඉහත සියළුම විදුහල්පතිවරුන් ඒ ඒ පළාත් රාජ්‍ය සේවය යටතේ විදුහල්පති තනතුරු සඳහා මුදාහැර ඇති අතර, මේ සම්බන්ධයෙන් අමා.ප./16/1813/742/025 – 1 හා 2016.09.27 හා 2016.10.04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙම නිලධාරීන් විදුහල්පති සේවයේ පුරප්පාඩු සහිත පළාත් සභා පාසල් වල විදුහල්පතිවරුන් ලෙසටම ස්ථාන ගත කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක ED/4/60/7/1/1/(5) 2016-11 හා 2016.10.14 දිනැති ලිපිය මගින් ඒ පිළිබඳව පළාත් බලධාරීන් දැනුවත් කර ඇති බවද දක්වා ඇත. ඒ එම ස්ථානගත කිරීම විධිමත්ව ඉටුකළේ නම් විදුහල්පති තනතුරුවල වැඩ බලන ගුරුවරුන් සැලකිය යුතු ප්‍රමාණයක් සිටිය නොහැකි අතර, විදුහල්පති විශේෂ දීමනා සම්බන්ධයෙන් අදාළ චක්‍ර ලේඛනය පරිදිම කටයුතු කිරීම තුළින් කිසිදු පාර්ශවයක් අගතියට පත් නොවන බවද ප්‍රකාශ කර ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2016.10.14 දිනැති ලිපිය මගින් සියළුම පළාත්වල ලේකම්වරු වෙත ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III වන පන්තියේ විදුහල්පතිවරුන් පත්කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් උපදෙස් ලබා දී තිබූ බව පළවන වගඋත්තරකාරිය විසින් සඳහන් කර ඇත. එහිදී ඔවුන් විදුහල්පති සේවයේ පුරප්පාඩු පැවැති පාසල් වල විදුහල්පතිවරුන් ලෙසටම ස්ථානගත කරන ලෙසට උපදෙස් ලබා දී තිබූ බව සඳහන් කර ඇත.

ඒ අනුව කටයුතු කර තිබේද යන්න පිළිබඳව කොමිෂන් සභාවේ පෙනී සිටි වගඋත්තර පාර්ශවීය නිලධාරීන් වෙතින් විමසීමේදී සඳහන් කර ඇත්තේ, එම ලිපිය අනුව කටයුතු කිරීමට නොහැකි වී ඇති බවත්, ඊට හේතුව ලෙස පහත සඳහන් ප්‍රායෝගික ගැටළු තිබූ බවත්ය.

එනම් දුෂ්කර පාසල් සඳහා නිලධාරීන් පත්වීම් භාරගැනීමට නොහැකි බවට අභියාචනා ඉදිරිපත් කර තිබූ බවත්, ඒවා සලකා බලා ඔවුන්ට නියෝජ්‍ය විදුහල්පති හා සහකාර විදුහල්පති තනතුරු ලබා දී ඇති බවත් ප්‍රකාශ කර ඇත. එමෙන්ම, වැඩ බැලීමේ විදුහල්පති ලෙස සේවය කළ නිලධාරීන් අදාළ පාසල් වල නිසි පරිදි සේවය ඉටු කිරීම හේතුකොටගෙන එම පාසල් ගැටළුවක් නොමැතිව පවත්වාගෙන යාමේ හේතුවද පාසල් සංවර්ධන සමිතිය හා වෘත්තීය සමිති වලින් එම වැඩ බලන විදුහල්පති ඉවත් නොකරන ලෙසට ඉල්ලීම් ඉදිරිපත් කර තිබීමද වැනි කරුණු සලකා බැලූ බවත් මෙහිදී සඳහන් කර

ඇත. එමෙන්ම පළාත තුළ පැවැති විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති සහ සහකාර විදුහල්පති තනතුරු සියල්ල සලකා බැලීමේදි පළාතට යොමුකර තිබූ ශ්‍රේණිධාරීන් සංඛ්‍යාව එම පුරප්පාඩු පිරවීමට ප්‍රමාණවත් නොවූ බවද ප්‍රකාශ කර ඇත.

**නිරීක්ෂණ :-**

පැමිණිලිකරුවන් සියල්ල විදුහල්පති සේවයේ වැඩ බැලීමේ කටයුතු කරන මීට පෙර එම විදුහල්පති විශේෂ දීමනාව ලබමින් සිටි පිරිසක් වේ.

අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2017.03.17 දිනැති අංක 16/2017 දරණ චක්‍රලේඛනය මඟින් විදුහල්පති විශේෂ දීමනාව සංශෝධනය කර ඇති අතර, එම සංශෝධනය සිදුකර ඇත්තේ 2017.02.07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වේ.

අමාත්‍ය මණ්ඩලය විසින් ගෙන ඇති තීරණය අනුව විදුහල්පති විශේෂ දීමනාව සංශෝධනය වීමක් (දීමනා වැඩිකිරීම) පමණක් සිදුවී ඇති අතර, එම දීමනාව ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන්ට පමණක් ගෙවන ලෙස හෝ වැඩබැලීමේ විදුහල්පතිවරුන්ට නොගෙවන ලෙසට තීරණය කර නොමැති බව නිරීක්ෂණය වේ.

2017.03.17 දිනැති 16/2017 චක්‍රලේඛය පැහැදිලි කිරීමක් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2017.03.29 දිනැති ලිපිය මඟින් සිදුකර ඇති අතර එම පැහැදිලිකිරීම අනුව ගුරු සේවයේ සිට විදුහල්පති සේවයේ වැඩබලන විදුහල්පතිවරුන් සඳහා මෙම දීමනාව ගෙවීම අත්හිටුවා ඇති බව නිරීක්ෂණය වේ.

නමුත් අමාත්‍ය මණ්ඩලය විසින් විදුහල්පති සේවයේ වැඩ බලන විදුහල්පතිවරුන් සඳහා මෙම දීමනාව නොගෙවිය යුතු බවට තීරණයක් ගෙන නොමැත. ඒ අනුව එය අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ගෙන ඇති තීරණයක් බව නිරීක්ෂණය වේ. මෙම තීරණය නිසා විදුහල්පති තනතුරේ වැඩ බැලීම සිදු කරන ලද විදුහල්පතිවරුන් සඳහා මෙම විශේෂ දීමනාව අහිමි වී ඇති බව නිරීක්ෂණය වේ.

මෙම දීමනාව නතර කිරීම සම්බන්ධයෙන් වගඋත්තරකරුවන් ලෙස කැඳවන ලද සියළුම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ විසින් එම දීමනාව ගෙවීමට රේඛීය අමාත්‍යාංශය තීරණය කරන්නේ නම් ඔවුන්ගේ විරෝධතාවයක් නොමැති බවට මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ කරුණු ඉදිරිපත් කොට ඇත.

රේඛීය අමාත්‍යංශය මෙම දීමනාව ගෙවීමට කොමිෂන් සභාව හමුවේ එකඟතාවයට පැමිණ නොමැති අතර, මානව හිමිකම් කොමිෂන් සභාව මේ පිළිබඳව නිර්දේශ ලබාදීමට තීරණය කර ඇත.

රේඛීය අමාත්‍යංශය අදාළ පළාත් සඳහා ප්‍රමාණවත් විදුහල්පති ශ්‍රේණිධාරීන් යවා ඇති බවත්, එසේ තිබියදී වැඩ බැලීමේ විදුහල්පතිවරුන් ලෙස ශ්‍රේණිධාරීන් නොවන ගුරුවරුන් පත්කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බවත් ප්‍රකාශ කර ඇති. පළාත් අධ්‍යාපන අමාත්‍යංශය විසින් ප්‍රමාණවත් විදුහල්පති ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන්ගේ පුරප්පාඩු තවදුරටත් විශාල සංඛ්‍යාවක් ඇති බවට දත්ත හා සංඛ්‍යා ලේඛන සමඟ ඉදිරිපත් කර ඇත.

ඒ අනුව වැඩබැලීමේ විදුහල්පතිවරුන් ලෙස පත්කිරීම හෝ නොකිරීම පිළිබඳව තීරණය කිරීමට අධ්‍යාපන අමාත්‍යංශයට බාධාවක් නොමැති නමුත් වැඩබැලීමේ විදුහල්පතිවරු ලෙස පත්කර විදුහල්පති විශේෂ දීමනාව ගෙවමින් සිටි වැඩ බැලීමේ විදුහල්පතිවරුන්ට එම දීමනාව නතර කිරීම යුක්ති සහගත නොවන බව නිරීක්ෂණය වේ.

එමෙන්ම මීට පෙරද විදුහල්පති තනතුරේ වැඩබැලීම් සිදුකරන ලද විදුහල්පතිවරුන්ට එම දීමනාව ගෙවා තිබීම තුළින් ඔවුන් එම දීමනාවට හිමිකම් ඇති බව නීත්‍යානුකූල අපේක්ෂාවක් හටගන්නා බව නිරීක්ෂණය වේ.

ඉහත සියළුම පාර්ශවයන් විසින් ඉදිරිපත් කරන ලද කරුණු සලකා බැලීමේදී වැඩ බැලීමේ විදුහල්පතිවරුන් ලෙස තවදුරටත් සේවයේ යොදවමින් මෙසේ ගෙවමින් සිටි විදුහල්පති විශේෂ දීමනාව නතර කිරීම පැමිණිලිකරුවන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් ලෙස නිරීක්ෂණය වේ.

නිගමනය :-

ඒ අනුව වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුවන් වෙත මෙතෙක් ගෙවමින් තිබූ විදුහල්පති විශේෂ දීමනාව නතර කිරීම තුළින් <u>1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව</u> උල්ලංඝනය කරමින් වෙනස්කමකට භාජණය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

මේ අනුව 2017.03.14 දිනැති 16/2017 දරණ චක්‍රලේඛනය ප්‍රකාරව ගෙවිය යුතු විදුහල්පති විශේෂ දීමනාව වැඩ බලන විදුහල්පතිවරුන් වෙතද ගෙවීම් නතර කළ දින සිට නැවත ගෙවීම කරන ලෙසට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2019. 02.28 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මාන හිමිකම් කොමිෂන් සභාව

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මාන හිමිකම් කොමිෂන් සභාව

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :-

1. අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් මහතා
   අධ්‍යාපන අමාත්‍යාංශය
   ඉසුරුපාය, බත්තරමුල්ල.

2. ලේකම්,
   රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
   177, නාවල පාර, නාරාහේන්පිට,
   කොළඹ 07.

B/

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 17/2005

මගේ අංකය : ආ/1/1/2/4/1
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය;
කොළඹ 07.
2005.10.[illegible]

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැවරී ඇති කාර්යයන් ඉටුකිරීමේදී රාජ්‍ය ආයතනවල සහාය ලබා දීම**

1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතෙහි 10 වගන්තිය මගින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පවරා ඇති කර්තව්‍ය අතරින් පහත සඳහන් කර්තව්‍යයන් කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

(අ) මූලික අයිතිවාසිකම්වලට අදාල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධි විධාන අනුව ක්‍රියා කරනු ලබන බවට සහතික කිරීමේ අදහසින් සහ මූලික අයිතිවාසිකම්වලට ගරු කිරීම හා ඒවා පිළිපැදීම ප්‍රවර්ධනය කිරීම පිණිස විධායක හා පරිපාලනමය පිළිවෙත් හා කාර්ය පටිපාටි පිළිබඳව සූපරීක්ෂාවෙන් සිටීම ;

(ආ) මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම හෝ උල්ලංඝනය කිරීමට අත්‍යාසන්නව තිබීම සම්බන්ධයෙන් වූ පැමිණිලි පිළිබඳ විභාග කිරීම හා විමර්ශනය කිරීම සහ මෙහි මින් මතු සලසා ඇති විධිවිධානවලට අනුකූලව සමථයට පත්කිරීමේ හා සමගි කිරීමේ මාර්ගයෙන් ඒවා විසඳීම සඳහා විධිවිධාන සැලැස්වීම ;

(ඇ) මූලික අයිතිවාසිකම් වැඩිදියුණු කිරීමේ, ප්‍රවර්ධනය කිරීමේ හා ආරක්ෂා කිරීමේ නීතිමය සහ පරිපාලනමය විධාන හා කාර්ය පටිපාටි සකස් කිරීමෙහි ලා ආණ්ඩුවට උපදෙස් දීම සහ සහාය වීම ;

මානව හිමිකම් කොමිසම විසින් ඉහත කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමේදී ඔබ ආයතනයට අදල වන කාර්යයන් සම්බන්ධයෙන්, කරනු ලබන පරීක්ෂණ වලදී එම කොමිෂන් සභාව වෙත වගකීමකින් යුතුව කරුණු ඉදිරිපත් කරන ලෙසත්, මානව හිමිකම් කඩවීම සම්බන්ධව කොමිෂන් සභාව කරනු ලබන නිර්දේශ ඔබ වෙත ලැබුනු විට එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට විධිමත් අනුමැතිය අදල බලධාරීන්ගෙන් ලබාගැනීමෙන් පසු ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු කල යුතු බවත් මෙයින් දන්වමි.

ඩී.දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

T-cir/md